# 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනත

1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක (සේවය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනතේ 66 වන වගන්තියේ පැවරී ඇති බලතල ප්‍රකාර, කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, උත්තර මන්ත්‍රී මණ්ඩලය සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග.

එම්. සී. එම්. කලීල්
කම්කරු අමාත්‍ය

1954 ඔක්තෝබර් මස 13 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග, 1954 සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවය සහ පාරිශ්‍රමික විධිමත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**
**සේවය විධිමත් කිරීම.**

1978.04.21 දින අංක 314 දරන ගැසට් පත්‍රය.

2. (1) කිසිම ස්ත්‍රියක සහ වයස අවුරුදු දහඅට සම්පූර්ණ කර නොමැති කිසිම පුරුෂයකු (විවේක ගැනීම හෝ ආහාර ගැනීම සඳහා වූ විවේක කාලය සහ වැඩ නතර කිරීම සඳහා 4 වන නියෝගය යටතේ අවසර දී ඇති කාලයක් ඇතුළුව) දිනකට පැය නවයකට වැඩි යම් කාලසීමාවක්, කිසියම් සාප්පුවක හෝ කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් හෝ නියුක්ත කර ගනු නොලැබිය යුතුය.

(2) 40 වන වගන්තිය යටතේ වූ වැසීමේ නියමයක් අදාළ කර ඇති කිසියම් සාප්පුවක ව්‍යාපාරයෙහි හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් සේවයේ නියුක්ත කර ඇති කිසිම තැනැත්තකු, කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව, දිනකට පැය 8 ක් ඉක්මවන හෝ සතියකට පැය 45 ක් ඉක්මවන කාලසීමාවක්

LABOUR DEPARTMENT OF SRI LANKA

සේවයේ නියුක්ත කර ගනු නොලැබිය යුතු ය.

1974.05.10 දින අංක 111 දරන ගැසට් පත්‍රය.

3. වයස අවුරුදු දහඅට සම්පූර්ණ කර ඇති යම් ස්ත්‍රියක්, ගුවන් තොටුපලක ගුවන් ගමන් සමාගමක් විසින් පවත්වා ගෙන යන කාර්යාලයක ගොඩබිම සංග්‍රාහිකාවකගේ කාර්යාලයෙහි හෝ යම් නේවාසික හෝටලයක අමුත්තන් පිළිගන්නියකගේ, කාන්තා කබා කාමර සේවිකාවකගේ, කාන්තා ඇඳුම් කාමර සේවිකාවකගේ හෝ කාන්තා වැසිකිළි සේවිකාවකගේ කාර්යයෙහි හෝ පෙරවරු 6 ට සහ පස්වරු 6 න් පසුව සේවයේ නියුක්ත කරනු ලැබිය හැකිය.

1956.03.02 දින අංක 10,899 දරන ගැසට් පත්‍රය.

1961.07.21 දින අංක 12553 දරන ගැසට් පත්‍රය.

4. යම් නේවාසික හෝටලයක, සමාජ ශාලාවක, නෘත්‍ය ශාලාවක හෝ වෙනත් විනෝදාගාරයක හෝ ගුවන් තොටුපලක පිහිටා ඇති යම් සාප්පුවක හෝ යම් ගුවන් සමාගමක් විසින් ගුවන් තොටුපලක පවත්වා ගෙන යනු ලබන යම් කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් හෝ යම් අධ්‍යාපන ආයතනයකට අනුබද්ධ ඇත්තා වූද, ඒ ආයතනයේ ශිෂ්‍යයන් විසින් නේවාසිකව සිටීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන්නා වූ ද, නේවාසිකාගාරයක හෝ ශිෂ්‍ය නිවාසයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් යම් තැනැත්තකු නියුක්ත කර ගනු ලබන සාමාන්‍ය සේවා කාලය, ඒ තැනැත්තාට සතියේ භාග නිවාඩුව දී ඇති දිනය නොවන වෙනත් කවර හෝ දිනයක දී දීර්ඝ කිරීමේ දී මේ පනතේ විධිවිධාන යටතේ විවේකය හෝ ආහාර ගැනීම සඳහා දී ඇති යම් විවේක කාලයක් හැර පැය තුනක් නොඉක්මවන එක් විවේක කාලයක වැඩ නවත්වා තැබීමක් කළ හැකි ය.

5. යම් සේවා නියුක්තයකුට 4 වන වගන්තිය යටතේ යම් විවේක කාලයක් දෙන ලද අවස්ථාවක, එම සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි හෝ එම සේවා යෝජකයා ගේ පාලනය යටතේ ඇති වෙනත් යම් ස්ථානයක හෝ නැවතී සිටින ලෙස ඒ සේවා නියුක්තයාට ඔහුගේ සේවා යෝජක විසින් නියම නොකල යුතු ය. තවද, සේවා යෝජකයාගේ ප්‍රකාශිත හෝ ව්‍යංජිත අනුමැතිය නොමැතිව හෝ ඉටු කිරීම පිණිස එම සේවා නියුක්තයාට වැඩ නියම කරන තුරු බලා සිටීම නොවන ස්වකීය සේවා නියුක්තියට අසම්බන්ධ යම් කාර්යයක් සඳහා හෝ ඒ සේවා නියුක්තයා එවැනි යම් ස්ථානයක රැඳී සිටින ලදැයි සේවා යෝජක විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, එසේ එවැනි යම් ස්ථානයක ඒ සේවා නියුක්තයා රැඳී සිටි සියලු කාලය තුල දී ඒ සේවා නියුක්තයාට ඒ විවේක කාලය දෙන ලද සේ

LABOUR DEPARTMENT OF SRI LANKA

නොසැලකිය යුතු ය.

6. යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් යම් තැනැත්තකු අතිකාල සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි කාලසීමාව යම් සතියක දී පැය දොළහක එකතුවක් ඉක්ම නොවිය යුතු ය.

7. කිසිම තැනැත්තකු යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් අතිකාල සේවයෙහි නියුක්ත කිරීම, එම අතිකාල වැඩ සඳහා එක් එක් පැය වෙනුවෙන්, ඔහුගේ සාමාන්‍ය පාරිශ්‍රමිකයේ එක් පැයක ප්‍රමාණය මෙන් එකහමාරකට නොඅඩු ප්‍රමාණයක් මත ඔහුට වෙනම ගෙවනු ලබන්නේ නම් මිස, නොකළ යුතු ය. ඔහු විසින් අතිකාල වැඩ කරන ලද පැයකින් යම් කොටසක් සඳහා ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඒ කොටස හා ඒ පැය අතර අනුපාතය අනුව තීරණය කළ යුතු ය.

8. අතිකාල පාරිශ්‍රමික ගණන් බැලීමේ කාර්යය සඳහා පැයකට ගෙවන පාරිශ්‍රමික ප්‍රමාණය :-

(අ) දෛනික ගෙවීම් ප්‍රමාණයක් මත පාරිශ්‍රමිකය ගෙවිය යුතු අවස්ථාවක දෛනික ගෙවීම් ප්‍රමාණයෙන් අටෙන් එකක් වන්නේ ය.

(ආ) මාසික ගෙවීම් ප්‍රමාණයක් මත පාරිශ්‍රමිකය ගෙවිය යුතු අවස්ථාවක තිහෙන් බෙදන ලද මාසික ගෙවීම් ප්‍රමාණයෙන් අටෙන් එකක් වන්නේ ය.

(ඇ) දෙසතියක ගෙවීම් ප්‍රමාණයක් මත පාරිශ්‍රමිකය ගෙවිය යුතු අවස්ථාවක දහ හතරෙන් බෙදන ලද දෙසතියක ගෙවීම් ප්‍රමාණයෙන් අටෙන් එකක් වන්නේ ය, තවද,

(ඈ) සතියක ගෙවීම් ප්‍රමාණයක් මත පාරිශ්‍රමිකය ගෙවිය යුතු අවස්ථාවක හතෙන් බෙදන ලද සතියක ගෙවීම් ප්‍රමාණයෙන් අටෙන් එකක් වන්නේ ය.

8 අ. යම් සේවා නියුක්තයකු විසින් යම් සතියක් තුළ සාමාන්‍ය උපරිම කාලසීමාව වන පැය 45 ඉක්මවා කරන ලද වැඩ සම්බන්ධයෙන් අතිකාල ගණන් බැලීමේ කාර්යයේ දී ඒ සේවා නියුක්තයා ඒ සතිය තුළ අනුමත

LABOUR DEPARTMENT OF SRI LANKA

නිවාඩු පිට හෝ ප්‍රකාශ නිවාඩු පිට හෝ සිටි යම් දිනයක්, ඒ අනුමත නිවාඩුව හෝ ප්‍රකාශ නිවාඩුව දෙන ලද්දේ පනතේ විධිවිධාන යටතේ වුවද නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ වුවද, ඒ දිනය පනතේ 3 වන වගන්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන යටතේ එක් දිනයක් සඳහා නියමිත සාමාන්‍ය උපරිම සේවා කාලය ඒ සේවා නියුක්තයා විසින් වැඩ කරන ලද දිනයක් ලෙස සැලකිය යුතු ය.

9. (1) 8 වන නියෝගයේ කාර්යයන් සඳහා තැනැත්තකුට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය -

(අ) පනතේ විධිවිධාන යටතේ තීරණයක් බලාන්විතව පවතින අවස්ථාවක ඒ තීරණයෙහි නිශ්චය කොට දැක්වෙන වේතනය වන්නේ ය,

තවද,

(ආ) එවැනි තීරණයක් බලාන්විතව නොමැත්තා වූ හෝ එවැනි යම් තීරණයක් යටතේ ඔහුට අදාළ වන පාරිශ්‍රමිකයට වඩා වාසිදායක පාරිශ්‍රමිකයක් ඔහු ලබමින් සිටින්නාවූ හෝ අවස්ථාවක ඔහුගේ සේවා නියුක්ති ගිවිසුම ප්‍රකාර ඔහුට ගෙවිය යුතු නියම පාරිශ්‍රමික ප්‍රමාණය වන්නේ ය.

(2) මේ නියෝගයේ කාර්යය සඳහා පාරිශ්‍රමික ප්‍රමාණය ගණන් බැලීමේ දී ජීවන වියදමට අනුව තීරණය කරන ලද විශේෂ ජීවනාධාර දීමනාවක් හැර වෙනත් දීමනාවක් ඇතුළත් නොකළ යුතු ය.

10. (1) පනතේ 12(1) වන වගන්තියේ කාර්යය සඳහා නියමිත නිලධරයා පහත සඳහන් නිලධරයන්ගෙන් යම් නිලධරයකු විය යුතු ය:-

කොමසාරිස්වරයා,

නියෝජ්‍ය කොමසාරිස්වරයෙක්,

සහකාර කොමසාරිස්වරයෙක්,

(2) පනතේ 12(1) වන වගන්තිය යටතේ වූ සෑම අවසර පත්‍රයක් ම මෙහි උප ලේඛනයේ "අ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

11. (1) පනතේ 14 වන වගන්තියේ කාර්යය සඳහා නියමිත නිලධරයා, 10 වන නියෝගයෙහි නිශ්චය කොට දැක්වෙන නිලධරයන්ගෙන් යම් නිලධරයකු විය යුතු ය.

(2) පනතේ 14(1)(අ) වන වගන්තියේ කාර්යය සඳහා නියමිත දුර ප්‍රමාණය යාර පනහක් විය යුතු ය.

(3) පනතේ 14(1) වන වගන්තිය යටතේ වූ සෑම සහතිකයක් ම, මෙහි උප ලේඛනයේ "ආ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(4) ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අය සේවයෙහි නියුක්ත කර ඇති යම් සාප්පුවක් හෝ කාර්යාලයක් සම්බන්ධයෙන් වන විට, ඒ සාප්පුවේ හෝ කාර්යාලයේ ස්ත්‍රී සේවා නියුක්තයන්ගේ තනි පාවිච්චිය සඳහා නියමිත දුර ප්‍රමාණය තුළ වෙන ම සෞඛ්‍යාරක්ෂක වැසිකිළි පහසුකම් හා සේදීමේ පහසුකම් ඇත්නම් මිස, පනතේ 14(1) වන වගන්තිය යටතේ කිසිම සහතිකයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

12. යම් අභියාචනයක් සම්බන්ධයෙන් පනතේ 14(6) වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයකු විසින් දෙනු ලැබීමට නියමිත දැන්වීම -

(අ) උප ලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූල විය යුතු ය, තවද,

(ආ) අභියාචනය විභාග කරන දිනයට අඩුම වශයෙන් දින දහ හතරකට පෙර අදාළ නිලධරයා වෙත පෞද්ගලිකව බාර දෙනු ලැබිය යුතු ය, නැතහොත් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ය.

13. පනතේ 15 වන වගන්තියේ කාර්යය සඳහා නියමිත බලධරයා 10 වන නියෝගයෙහි නිශ්චිත නිලධරයන්ගෙන් කිසිවකු විය යුතු ය.

14. පනතේ 16(2) වන වගන්තිය යටතේ ප්‍රදර්ශනය කරනු ලැබීමට නියමිත සෑම දැන්වීමක් ම, මෙහි උප ලේඛනයේ "ඇ" ආකෘතියට සාරානුකූලව විය යුතු අතර, එම දැන්වීමෙන් ආවේදිත සියලු තැනැත්තන්ට පහසුවෙන් බලා ගැනීමට හා කියවා ගැනීමට හැකි ආකාරයකට ප්‍රදර්ශනය කොට තැබිය යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

15. (1) සේවා නියුක්තයකු සේවයෙහි නියුක්ත කර ගනු ලැබූ දිනයෙහි සේවා යෝජකයකු විසින් පනතේ 17 වන වගන්තිය ප්‍රකාර ඒ සේවා නියුක්තයා වෙත සපයනු ලැබීමට නියමිත සේවා නියුක්ති කොන්දේසිවලට අදාළ විස්තරවලට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය:

(අ) සේවා නියුක්තයාගේ නම සහ පදවි නාමය සහ පත්වීමේ ස්වභාවය,

(ආ) පත්වීම ක්‍රියාත්මක වන දිනය,

(ඇ) එම තැනැත්තා පත් කරනු ලබන්නේ කවර ශ්‍රේණියකටද යන වග,

(ඈ) මූලික පාරිශ්‍රමිකය සහ පාරිශ්‍රමික පරිමාණය,

(ඉ) පාරිශ්‍රමිකය ගෙවනු ලබන්නේ සතිපතාද, දෙසතියකට වරක් ද, නැතිනම් මාසිකව ද යන වග,

(ඊ) ජීවන වියදම් දීමනා කිසිවක් ඇත්නම් එය සහ වෙනත් දීමනා කිසිවක් ඇත්නම් ඒවා,

(උ) (I) පරිවාස හෝ පරීක්ෂණ කාලසීමාවක් ඇත්නම් එම කාලසීමාව සහ එම පරිවාස හෝ පරීක්ෂණ කාලසීමාවට බලපාන කොන්දේසි,

(II) එම පරිවාස හෝ පරීක්ෂණ කාලසීමාව තුළ දී පත්වීම අවසන් කරනු ලැබිය හැක්කේ යම් හේතු යටතේ ද, එම හේතු,

(ඌ) (I) සේවා නියුක්තියට බලපාන කොන්දේසි,

(II) සේවා නියුක්තිය අවසන් කළ හැක්කේ යම් හේතු හා කොන්දේසි යටතේ ද, එම හේතු හා කොන්දේසි,

(එ) වැඩ කළ යුතු සාමාන්‍ය වේලාව,

LABOUR DEPARTMENT OF SRI LANKA

(ඒ) එම තැනැත්තාට හිමිකම් ඇති සතිපතා නිවාඩු, වාර්ෂික නිවාඩු, අනියම් සහ වරප්‍රසාද නිවාඩු ගණන,

(ඔ) අතිකාල ගෙවීමේ ප්‍රමාණය,

(ඕ) සේවා යෝජක විසින් වෛද්‍ය ආධාර සලසන්නේ නම්, ඒ වෛද්‍ය ආධාර,

(ක) සේවා නියුක්තියට අදාළ යම් අර්ථ සාධක අරමුදලක්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හෝ පාරිතෝෂික යෝජනා ක්‍රමයක් සැලසීම සහ ඒවාට බලපාන කොන්දේසි,

(ග) උසස්වීමට ඇති ඉඩකඩ,

(2) ඉහත සඳහන් කළ සියලු විස්තර, සේවා යෝජකගේ අත්සනින් සහතික කරනු ලැබ, සේවා නියුක්තයා හොඳින් දන්නා භාෂාවෙන් වූ ලියවිල්ලකින් ඔහුට දිය යුතු ය. සේවා යෝජක විසින් තබා ගත යුතු අනු පිටපතක, එම විස්තර ලැබුණ බව සේවා නියුක්තයා විසින් සඳහන් කරනු ලැබිය යුතු ය.

16. පනතේ 18(ආ) වන වගන්තිය යටතේ සේවා යෝජක විසින් තබා ගනු ලැබීමට නියමිත සෑම ලේඛනයක් ම මෙහි උප ලේඛනයෙහි "ඉ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එදිනෙදා තෙක් එය නිවැරදි කර තිබිය යුතු ය.

17. සෑම සේවා යෝජකයකු විසින් ම, එක් එක් සේවා නියුක්තයා සම්බන්ධයෙන් -

(I) මෙහි උප ලේඛනයේ "ඊ" ආකෘතියට සාරානුකූල සේවා වාර්තාවක, සහ

(II) පාරිශ්‍රමික ගෙවනු ලබන (මෙහි මින් මතු පාරිශ්‍රමික කාලසීමාව යනුවෙන් සඳහන් කරනු ලබන අවස්ථාවෝචිත පරිදි මාසික, දෙසති හෝ සති) එක් එක් කාලසීමාව සඳහා පහත සඳහන් විස්තර අඩංගු පාරිශ්‍රමික වාර්තාවක් තබා ගත යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

(අ) සේවා නියුක්තයාගේ නම,

(ආ) වයස,

(ඇ) ස්ත්‍රී, පුරුෂ භාවය,

(ඈ) පන්තිය හෝ ශ්‍රේණිය, එවැන්නක් තිබේ නම්,

(ඉ) වර්ගය හෝ පදවි නාමය හෝ රැකියාව,

(ඊ) පාරිශ්‍රමික කාලසීමාව, (මාසික ද, දෙසති ද නැත්නම් සති ද යන්න)

(උ) පාරිශ්‍රමික කාලසීමාව තුළ දී වැඩ කරන ලද පැය ගණන,

(ඌ) පාරිශ්‍රමික කාලසීමාව තුළ දී වැඩ කරන ලද අතිකාල පැය ගණන,

(එ) ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය,

(ඒ) ගෙවිය යුතු දීමනා (එක් එක් දීමනාව වෙන වෙන ම සඳහන් කළ යුතු ය)

(ඔ) පාරිශ්‍රමික කාලසීමාව සඳහා උපයන ලද දළ පාරිශ්‍රමිකය,

(ඕ) දළ පාරිශ්‍රමිකයෙන් කරන ලද සියලු අඩු කිරීම, (එක් එක් අඩු කිරීම වෙන වෙන ම දැක්විය යුතු ය.)

(ක) පාරිශ්‍රමික කාලසීමාව තුළ දී පාරිශ්‍රමිකයෙන් ගෙවන ලද සියලු අත්තිකාරම්,

(ග) පාරිශ්‍රමික කාලසීමාව වෙනුවෙන් යම් විශ්‍රාම වැටුපකට හෝ අර්ථ සාධක අරමුදලකට පිළිවෙලින් සේවා යෝජක සහ සේවා නියුක්තයා විසින් ගෙවන ලද දායක මුදල්,

(ච) ගෙවන ලද ඉතිරි පාරිශ්‍රමික ප්‍රමාණය සහ ගෙවන ලද දිනය,

(ජ) එක් එක් පාරිශ්‍රමික කාලසීමාව වෙනුවෙන් ගෙවන ලද මුළු අතිකාල පාරිශ්‍රමික ප්‍රමාණය,

LABOUR DEPARTMENT OF SRI LANKA

(ට) ආදායම් බදු ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අධිකරණ ආඥාවක් යටතේ හෝ අය කර ගන්නා ලද මුදල,

(ඩ) ශුද්ධ පාරිශ්‍රමිකය ලැබුණ බවට සාක්ෂි වශයෙන් සේවා නියුක්තයාගේ සටහන.

(2) (1) වන ඡේදයෙහි සඳහන් සෑම වාර්තාවක් ම සේවා යෝජක විසින් එදිනෙදාට සම්පූර්ණ කළ තත්වයෙන් තබා ගත යුතු ය.

## II වන කොටස
## පාරිශ්‍රමික ගෙවීම.

18. සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයන්, සේවා යෝජක විසින් පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන්, පනතේ 19(I)(අ)(III) වන වගන්තිය අනුව අඩු කිරීම් කරනු ලැබිය හැකි ය.

(1) කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් අනුමත කරනු ලැබුවා වූ ද, සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ සේවා යෝජක විසින් මෙහෙයවනු ලබන්නා වූ ද යම් විශ්‍රාම වැටුප් අරමුදලකට, අර්ථ සාධක අරමුදලකට, රක්ෂණ ක්‍රමයකට, ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමයකට හෝ විනෝද සමාජයකට සේවා නියුක්තයා විසින් දීමට කැමති යම් දායක මුදලක්,

(2) සේවා යෝජක විසින් සේවා නියුක්තයා වෙත සපයන ලද යම් ආකාරයක හෝ යම් ආහාර ද්‍රව්‍යයක මිල හෝ සලසන ලද නැවතීමේ පහසුකම් සඳහා යම් ගාස්තුවක්,

(3) සේවා යෝජක විසින් සේවා නියුක්තයා වෙත සපයන ලද යම් නිවාසයක කුළිය,

(4) සේවා නියුක්තයා විසින් ඇප වශයෙන් ඉදිරිපත් කළ යුතු මුදල වන්නා වූ ද, ඒ සඳහා අඩු කළ යුතු වූ මුදල, වේතනයෙන් කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් ප්‍රතිශතයක් නොඉක්ම වන්නා වූ ද මුදලක්,

LABOUR DEPARTMENT OF SRI LANKA

(5) සේවා නියුක්තයා සඳහා සේවා යෝජක විසින් සපයන ලද යම් පහසුකම් හෝ සේවාවන් සඳහා ගාස්තුවක් වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් අනුමත කරන ලද මුදලක්,

(6) සේවා නියුක්ත ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක සේවා යෝජක විසින් විකිණීම සඳහා තබා ඇති බඩු වලින් සේවා නියුක්තයාට විකුණන ලද්දා වූ ද, (2) වන විෂයෙහි සඳහන් බඩු නොවන්නා වූ ද යම් බඩු වල මිල,

(7) පහත සඳහන් ක්‍රියා හෝ නොකර හැරීමේ කිසිවක් සම්බන්ධයෙන් සේවා යෝජක විසින් සේවා නියුක්තයාට පනවන ලද දඩයක් -

(අ) සාධාරණ හේතුවක් නොදක්වා වැඩට පැමිණ නොසිටීම,

(ආ) සාධාරණ හේතුවක් නොදක්වා ප්‍රමාද වී වැඩට පැමිණීම,

(ඇ) සේවා යෝජකට අයත් බඩුවලට හෝ භාණ්ඩවලට අලාභහානි කිරීම හෝ ඒවා නැතිවීමට සැලැස්වීම, එම අලාභ හානිය හෝ නැතිවීම කෙළින් ම සේවා නියුක්තයාගේ නොසැලකිල්ල සිතා මතා කළ ක්‍රියාව හෝ පැහැර හැරීම නිසා විය යුතු ය.

(ඈ) වැඩ සම්බන්ධයෙන් උදාසීනත්වය හෝ නොසැලකිල්ල,

(ඉ) වැඩ කළ යුතු වේලාවේ දී නිදා සිටීම,

(ඊ) සේවා නියුක්තයාට, ඔහුගේ වැඩ සම්බන්ධයෙන් දෙන ලද යම් නීත්‍යානුකූල නියමයකට අනුව ක්‍රියා කිරීම, ඔහු චුවමනාවෙන් ම පැහැර හැරීම,

(උ) සේවා යෝජකට අයිති බඩු හෝ භාණ්ඩ සොරකම් කිරීම හෝ සේවා යෝජකගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් වංචා කිරීම හෝ වංක වීම,

(ඌ) වැඩ කරන කාලය තුළ බීමත්ව සිටීම,

(එ) සිතා මතාම අකීකරු වීම හෝ සිතා මතාම විනය කඩ කිරීම,

LABOUR DEPARTMENT OF SRI LANKA

(ඡ) ගනුදෙනු කිරීම සඳහා සේවා යෝජකගේ ස්ථානයට පැමිණෙන මහජනයාගෙන් කිසිවකුට ආචාරශීලී නොවීම,

(ඞ) ව්‍යාජ ලෙඩ ගැනීම,

(ඞ) සේවා යෝජකගේ ස්ථානයෙහි සවිකර ඇති යම් ආරක්ෂක උපකරණවලට බාධා කිරීම,

(ක) තම සේවා නියුක්තියට අදාළ නොවන අත් පත්‍රිකා, පත්‍රිකා හෝ දැන්වීම් පත්‍ර සේවා යෝජකගේ ස්ථානය ඇතුළත, එම ස්ථානය භාරව සිටින තැනැත්තාගේ පූර්ව අවසරය නොලබා බෙදා හැරීම හෝ ප්‍රදර්ශනය කිරීම,

(ග) සේවා යෝජකගේ ස්ථානයෙහි පිරිසිදුකම පවත්වා ගෙන යාම සඳහා දී ඇති උපදෙස් උල්ලංඝනය කිරීම,

(ච) සේවා යෝජක විසින්, එම ස්ථානයෙහි දුම් පානය තහනම් කර තිබෙන යම් කොටසක දුම් පානය කිරීම,

(8) සේවා යෝජක විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ පාලනය කරනු ලබන යම් අරමුදලකින් සේවා නියුක්තයා විසින් ලබා ගන්නා ලද යම් ණය මුදල්,

(9) පනතේ (19)( I)(අ)(II) වන වගන්තියේ විධිවිධානවලට අනුව, සේවා නියුක්තයාගේ ඉල්ලීම පිට සේවා යෝජක විසින් වෙනත් යම් තැනැත්තකුට කරන ලද යම් ගෙවීමක්,

(10) ප්‍රවර්තන පාරිශ්‍රමික කාලසීමාව සඳහා පාරිශ්‍රමික වශයෙන් සේවා නියුක්තයාට ලැබිය යුතු පාරිශ්‍රමිකයට නොඅඩු ණය මුදලක් හෝ අත්තිකාරම් මුදලක් වන සේවා යෝජක විසින් සේවා නියුක්තයාට ගෙවන ලද (8) වන විෂයෙහි සඳහන් යම් ණයක් හෝ අත්තිකාරම් මුදලක් හෝ සම්බන්ධයෙන් අය කළ යුතු පොලියක්,

එසේ වුව ද,

(අ) (3) වන විෂයෙහි සඳහන් යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වන කල්හි, එම අඩු කිරීමේ ප්‍රමාණය -

LABOUR DEPARTMENT OF SRI LANKA

(I) එම නිවස පිහිටා ඇති ප්‍රදේශයෙහි පළාත් පාලන ආයතනය විසින් එම නිවසෙහි කුලී වටිනාකම තක්සේරු කර ඇති විට, එම කුලී වටිනාකමට වැඩි නොවිය යුතු ය, තවද,

(II) එවැනි තක්සේරුවක් කර නොමැති විට, එම නිවස සම්බන්ධයෙන් දරන ලද ප්‍රාග්ධන වියදමෙන්, වර්ෂයකට සියයට හයකට වැඩි නොවිය යුතු ය,

(ආ) (7) වන විෂයෙහි සඳහන් යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වන කල්හි -

(I) යම් එක් වතාවක දී එම දඩ වෙනුවෙන් කරනු ලබන අඩු කිරීම්වල මුළු මුදල, එම දඩ නියම කරනු ලබන කාලසීමාව තුළ දී එම සේවා නියුක්තයා විසින් උපයන ලද පාරිශ්‍රමිකයෙන් සියයට පහකට වැඩි නොවිය යුතු ය, තවද,

(II) එසේ අඩු කරනු ලබන මුදල සේවා නියුක්තයන් සඳහා ප්‍රයෝජනවත් වන්නා වූ ද, කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් අනුමත කරනු ලැබූ කාර්යයක් වන්නා වූ ද, කාර්යයන් සඳහා සේවා යෝජක විසින් යොදනු ලැබිය යුතු ය.

(ඇ) (10) වන විෂයෙහි සඳහන් යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වන කල්හි අය කරනු ලබන පොලිය, අවස්ථාවෝචිත පරිදි මුල් මුදලින් හෝ අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදලින් වර්ෂයකට සියයට හයකට වැඩි නොවිය යුතු ය.

19. (1) සේවා නියුක්තයා විසින් ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කර ඇත්නම් මිස සේවා නියුක්තයාගේ යම් බැඳීමක් නිදහස් කිරීම සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා සේවා නියුක්තයාගේ ඉල්ලීම පිට වෙනත් යම් තැනැත්තකුට සේවා යෝජක විසින් කරන ලද යම් ගෙවීමක් වෙනුවෙන් සේවා යෝජක විසින් සේවා නියුක්තයාගේ පාරිශ්‍රමිකයෙන් කිසිම අඩු කිරීමක් නොකළ යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

(2) එවැනි සෑම ඉල්ලීමක ම -

(අ) (I) එම ගෙවීම කළ යුත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගේ නම සහ ලිපිනය,

(II) ගෙවිය යුතු මුදල,

(III) මුදල ගෙවිය යුතු වන දිනය, සහ

(IV) එම ගෙවීම කරනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යය සඳහන් කළ යුතු ය.

(ආ) සේවා නියුක්තයා විසින් අත්සන් කරනු ලැබිය යුතුය, තවද

(ඇ) එහි තම අත්සන් යෙදිය යුතු සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට දී කළ යුතු ය.

(3) ඒ ගෙවීම කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තාගෙන් ඒ ගෙවීම වෙනුවෙන් නිසි පරිදි අත්සන් තබන ලද කුවිතාන්සියක් සේවා යෝජක විසින් ලබා ගත යුතු ය. තවද ඒ කුවිතාන්සිය පරීක්ෂා කිරීම සඳහා සේවා නියුක්තයා විසින් ඉල්ලීමක් කරනු ලැබුවහොත් එය ඔහුගේ පරීක්ෂණය සඳහා ලබා දිය යුතු ය.

20. පාරිශ්‍රමික කාලසීමාව සඳහා සේවා නියුක්තයාට ගෙවිය යුතු පාරිශ්‍රමිකයෙන් ගෙවන ලද අත්තිකාරම් මුදලක් වන, සේවා යෝජක විසින් සේවා නියුක්තයාට ගෙවන ලද යම් අත්තිකාරම් මුදලක් වෙනුවෙන් යම් අඩු කිරීමක් කිරීමෙන් පසුව වෙනත් අඩු කිරීම් කිසිවක් ඇත්නම් ඒවා 18 වන නියෝගයෙහි දක්වා ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව අඩු කර ගනු ලැබිය යුතු ය.

21. (1) මේ නියෝගවල පෙරාතුව සඳහන් විධිවිධාන යටතේ, සේවා නියුක්තයකුගේ පාරිශ්‍රමිකයෙන් අඩු කිරීම් කරනු ලබන අවස්ථාවක සේවා යෝජක විසින්,

(අ) සේවා නියුක්තයාට විකුණන ලද යම් භාණ්ඩයක් වෙනුවෙන් වූ යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වූ විට -



LABOUR DEPARTMENT OF SRI LANKA

(I) ඒ භාණ්ඩය විකුණනු ලැබූ, ඒ සේවා නියුක්තයාගේ නම,

(II) එය විකුණනු ලැබූ දිනය,

(III) එය විකුණනු ලැබූ මිළ, සහ

(IV) එම විකිණීම වෙනුවෙන් අය කර ගැනීම් කරන ලද දිනයන් ඇතුළත් වාර්තාවක් තබා ගත යුතු ය.

(ආ) සේවා යෝජක විසින් නියම කරන ලද යම් දඩයක් වෙනුවෙන් වූ යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වූ විට -

(I) සේවා නියුක්තයාගේ නම,

(II) දඩය නියම කරනු ලැබූ දිනය,

(III) දඩයට හේතු,

(IV) නියම කරන ලද දඩ මුදල,

(V) එම දඩය වෙනුවෙන් අය කර ගැනීම් කරන ලද දිනයන් ඇතුළත් වාර්තාවක් තබා ගත යුතු ය,

(ඇ) සේවා නියුක්තයා විසින් සපයනු ලැබීමට නියමිත යම් ඇපයක් වෙනුවෙන් වූ යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වූ විට -

(I) ඒ අඩු කිරීම්වල වාර්තාවක් තබා ගත යුතුය, තවද

(II) එසේ අඩු කරන ලද මුදල වෙනුවෙන් සේවා නියුක්තයාට කුවිතාන්සියක් දිය යුතු ය.

(ඈ) සේවා නියුක්තයාට සේවා යෝජක විසින් අත්තිකාරම් වශයෙන් දෙන ලද යම් මුදලක් වෙනුවෙන් වූ යම් අඩු කිරීමක් සම්බන්ධයෙන් වූ විට -

(I) සේවා නියුක්තයාගේ සම්පූර්ණ නම,

(II) අත්තිකාරම් වශයෙන් දෙන ලද මුදල,

LABOUR DEPARTMENT OF SRI LANKA

(III) අත්තිකාරම් මුදල දෙන ලද දිනය,

(IV) එම අත්තිකාරම් මුදල වෙනුවෙන් අය කිරීම් කරන ලද දිනයන්,

(V) අත්තිකාරම් මුදල ලැබුණ බවට සේවා නියුක්තයාගේ අත්සන ඇතුළත් වාර්තාවක් තබා ගත යුතු ය.

(2) (1) වන ඡේදයෙහි සඳහන් සෑම වාර්තාවක් ම, පරීක්ෂා කිරීම සඳහා සේවා නියුක්තයා විසින් ඉල්ලීමක් කරනු ලැබුවහොත් එය ඔහුගේ පරීක්ෂණය සඳහා ලබා දිය යුතු ය.

## III වන කොටස
## (අ) කැමැත්ත ඇතිව තීරණය කිරීම.

22. (1) පනතේ "21(1)" වන වගන්තිය යටතේ නියමයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම -

(අ) එම ඉල්ලුම් පත්‍රය තනි සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වන අවස්ථාවක, එම සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සේවා නියුක්තයන්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනක් විසින් හෝ එම සේවා නියුක්තයන්ගේ සේවා යෝජක හෝ සේවා යෝජකයින් විසින් හෝ කළ යුතු ය.

(ආ) එම ඉල්ලුම් පත්‍රය එක් සාප්පුවකට හෝ කාර්යාලයකට වැඩි ගණනක සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වන අවස්ථාවක ඒ එක් එක් සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සේවා නියුක්තයින්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනක් විසින් හෝ සේවා නියුක්තයින්ගේ එම ප්‍රමාණයෙහි අවස්ථාවෝචිත පරිදි සේවා යෝජක හෝ සේවා යෝජකයින් විසින් හෝ කළ යුතු ය; තවද

(ඇ) එම ඉල්ලුම් පත්‍රය තනි සාප්පුවක හෝ කාර්යාලයක හෝ එක් සාප්පුවකට හෝ කාර්යාලයකට වැඩි ගණනක හෝ යම් පන්තියක නැතහොත් වර්ගයක සේවා නියුක්තයන්

LABOUR DEPARTMENT OF SRI LANKA

සම්බන්ධයෙන් වන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එම සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි හෝ ඒ එක් එක් සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි හෝ එම පන්තියේ නැතහොත් වර්ගයේ සේවා නියුක්තයන්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනක් විසින් හෝ සේවා නියුක්තයින්ගේ එම සියයට ප්‍රමාණයෙහි සේවා යෝජක හෝ සේවා යෝජකයින් විසින් හෝ කළ යුතු ය.

(2) එවැනි සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උප ලේඛනයේ "ඊ" ආකෘතියෙහි විය යුතු ය.

23. පනතේ 22 වන වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලබන සෑම පරීක්ෂණයකදී ම --

(1) සේවා යෝජක නියෝජනය කිරීම සහ ඔහු වෙනුවෙන් කැමැත්ත දීම -

(අ) ඔහු සේවා යෝජකයින්ගේ වෘත්තිය සමිතියක සාමාජිකයෙක් නම් ඒ වෘත්තිය සමිතියේ නිලධාරියකු විසින්; හෝ

(ආ) ඔහු එවැනි වෘත්තිය සමිතියක සාමාජිකයකු නොවේ නම් ඔහු විසින් ම හෝ ඒ සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද යම් නියෝජිතයකු විසින් කරනු ලැබිය හැකි ය; තවද

(2) සේවා නියුක්තයන් නියෝජනය කිරීම සහ ඔවුන් වෙනුවෙන් කැමැත්ත දීම -

(අ) යම් වෘත්තිය සමිතියක සාමාජිකයන් වන සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ විට එම වෘත්තිය සමිතියේ නිලධාරියකු විසින් ද;

(ආ) කිසිම වෘත්තිය සමිතියක සාමාජිකයින් නොවන සේවා නියුක්තයින් සම්බන්ධයෙන් වූ විට, කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන නියෝජිතයන් සංඛ්‍යාවක් විසින් ද

LABOUR DEPARTMENT OF SRI LANKA

කරනු ලැබිය හැකි ය;

24. 23 වන නියෝගයෙහි සඳහන් යම් පරීක්ෂණයක දී යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන් වෘත්තිය සමිතියක් විසින් නියෝජනය කරනු ලබන සෑම අවස්ථාවක දී ම එම සේවකයින් විසින්, ඔවුන් නියෝජනය කරන වෘත්තිය සමිතියේ නම කොමසාරිස්වරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

25. කොමසාරිස්වරයා විසින් යෝජනා කරන ලද යම් තීරණයකට කැමැත්ත, එම තීරණය බලපාන යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන්ගෙන් හෝ යම් සාප්පුවක හෝ කාර්යාලයක යම් පන්තියක නැතහොත් වර්ගයක සේවා නියුක්තයන්ගෙන් හෝ සියයට පනස් එකකට නොඅඩු ගණනක් වෙනුවෙන් සේවා නියුක්තයන්ගේ නියෝජිතයකු හෝ නියෝජිතයින් හෝ විසින් දෙනු ලබන අවස්ථාවක එම තීරණයට කැමැත්ත අවස්ථාවෝචිත පරිදි, ඒ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සියලුම සේවා නියුක්තයන් විසින් හෝ ඒ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි එම පන්තියේ නැතහොත් වර්ගයේ සියලුම සේවා නියුක්තයන් විසින් හෝ දී ඇති ලෙස සලකනු ලබන්නේ ය.

26. (1) යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ විට, 23(2)(අ) නියෝගයෙහි විධිවිධාන සලසා ඇති පරිදි වෘත්තිය සමිතියක නිලධාරියකු විසින් යම් තීරණයකට දෙනු ලබන කැමැත්ත, 24 වන නියෝගය ප්‍රකාර කොමසාරිස්වරයා වෙත යවන ලද දැන්වීමෙහි අත්සන් තබා ඇති, ඒ සාප්පුවේ හෝ කාර්යාලයේ සේවා නියුක්තයන් වෙනුවෙන් පමණක් දෙන ලද එකඟත්වයක් වන්නේ ය.

(2) යම් සාප්පුවක හෝ කාර්යාලයක යම් සේවා නියුක්තයන් සම්බන්ධයෙන්, 23(2)(ආ) වන නියෝගයෙහි සඳහන් යම් නියෝජිතයින් විසින් යම් තීරණයකට කැමැත්ත දෙනු ලබන අවස්ථාවක ඒ එක් එක් නියෝජිතයා විසින් දෙන ලද කැමැත්ත එම නියෝජිතයින් පිළිබඳව තීරණය ගත් දිනයෙහි එම සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සිටි සේවා නියුක්තයින්ගේ මුළු සංඛ්‍යාව, නියෝජිත සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලබා ගත් සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව වෙනුවෙන් දෙන ලද කැමැත්ත ලෙස 25 වන වගන්තියේ

LABOUR DEPARTMENT OF SRI LANKA

කාර්යයන් සඳහා සලකනු ලබන්නේ ය.

27. පනතේ 22 වන වගන්තිය යටතේ කරන යම් තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම -

(1) සේවා යෝජක වෙනුවෙන් -

(අ) එම සේවා යෝජක, සේවා යෝජකයින්ගේ වෘත්තිය සමිතියක සාමාජිකයෙක් නම් ඒ වෘත්තිය සමිතියේ නිලධාරියකු විසින්;
හෝ

(ආ) එම සේවා යෝජක, වෘත්තිය සමිතියක සාමාජිකයකු නොවේ නම්, ඔහු විසින් ම හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරන ලද නියෝජිතයකු විසින් දෙනු ලැබිය හැකි ය;
තවද,

(2) සේවා නියුක්තයන් වෙනුවෙන් -

(අ) වෘත්තිය සමිතියක සාමාජිකයින් වන සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ විට සේවා නියුක්තයන් විසින් ලියවිල්ලකින් ඒ සඳහා බලය පවරන ලද, ඒ වෘත්තිය සමිතියේ නිලධාරියකු විසින්; සහ

(ආ) වෘත්තිය සමිතියක සාමාජිකයන් නොවන සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ විට, ඒ සේවා නියුක්තයන් විසින් ලියවිල්ලකින් ඒ සඳහා බලය පවරන ලද නියෝජිතයකු විසින් දෙනු ලැබිය හැකි ය.

28. පනතේ 24 වන වගන්තිය යටතේ වූ ප්‍රතික්ෂේප කිරීමේ සෑම දැන්වීමක් ම මෙහි උප ලේඛනයේ "ඌ" ආකෘතියට සාරානුකූල විය යුතු අතර, ඒ සෑම අවස්ථාවකදී ම 27 වන නියෝගය ප්‍රකාර දෙන ලද බලය පැවරීමේ ලියවිල්ල ඒ සමග තිබිය යුතු ය.

29. (1) යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන්ගෙන් හෝ යම් සාප්පුවක හෝ කාර්යාලයක යම් පන්තියක හෝ වර්ගයක සේවා නියුක්තයන්ගෙන් හෝ සියයට පනස් එකකට නොඅඩු ගණනක්

LABOUR DEPARTMENT OF SRI LANKA

වෙනුවෙන් යම් නියෝජිතයකු විසින් හෝ නියෝජිතයන් විසින් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම දෙනු ලබන අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම අවස්ථාවෝචිත පරිදි, එම සාප්පුවේ හෝ කාර්යාලයේ සියලුම සේවා නියුක්තයින් විසින් හෝ එම සාප්පුවේ හෝ කාර්යාලයේ යම් පන්තියක හෝ වර්ගයක සියලු සේවා නියුක්තයින් විසින් හෝ දී ඇති ලෙස සලකනු ලබන්නේ ය.

(2) යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවා නියුක්තයන් සම්බන්ධයෙන් වූ විට, 27(2) වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති පරිදි වෘත්තිය සමිතියක නිලධාරියකු විසින් හෝ බලය පවරනු ලැබූ නියෝජිතයකු විසින් හෝ දෙන ලද ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීමක්, ඒ නියෝගය ප්‍රකාර ලියවිල්ලකින් සිය බලය පැවරුම කළ, ඒ සාප්පුවේ හෝ කාර්යාලයේ සේවා නියුක්තයන් වෙනුවෙන් පමණක් දෙන ලද දැන්වීමක් වන්නේ ය.

30. පනතේ 22 වන වගන්තිය යටතේ යම් තීරණයකට කැමැත්ත හෝ පනතේ 24 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම හෝ වෘත්තිය සමිතියක් විසින් යම් සේවා යෝජකයකු වෙනුවෙන් දෙනු ලබන අවස්ථාවක, යම් පසු දිනයක ඔහු එම වෘත්තිය සමිතියෙහි සාමාජිකයකුව සිටීම නතර කර තිබීම හෝ එම වෘත්තිය සමිතියෙහි පැවැත්ම නතරව තිබීම නොතකා එම සේවා යෝජකයා පනතේ විධිවිධානවලට යටත්ව අවස්ථාවෝචිත පරිදි එම කැමැත්තෙන් හෝ දැන්වීමෙන් බැඳී සිටින්නේ ය.

(ආ) විනිශ්චය අධිකාර මගින් කරන තීරණ

31. පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මූල මණ්ඩලයකට යම් සාමාජිකයකු පත් කිරීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් කළ යුතු ය.

32. පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මූල මණ්ඩලයෙහි ලේකම් ලෙස නිලධරයකු පත් කරනු ලැබිය හැකිය. එම නිලධරයා ඉහත සඳහන් වගන්තිය යටතේ පිහිටුවනු ලබන යම් පාරිශ්‍රමික විනිශ්චය අධිකාරයක ලේකම් ද විය යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

33. පාරිශ්‍රමික විනිශ්චය අධිකාරයක් විසින් කලින් කරන ලද තීරණයක් පරිච්ඡින්න කරවා ගැනීම, වෙනස් කරවා ගැනීම හෝ ප්‍රතියෝජනය කරවා ගැනීම සඳහා පනතේ 26(4) වන වගන්තිය යටතේ සෑම ඉල්ලුම් පත්‍රයක් ම -

(අ) එම තීරණය එක් සේවා යෝජකයකුට පමණක් බලපාන අවස්ථාවක, එම සේවා යෝජක විසින් ම හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ ඔහු සාමාජිකයකුව සිටින වෘත්තිය සමිතියේ නිලධාරියකු විසින්;

(ආ) එම තීරණය එක් සේවා යෝජකයකුට වැඩි ගණනකට බලපාන අවස්ථාවක, එවැනි සේවා යෝජකයින්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනක් විසින් හෝ එවැනි සේවා යෝජකයින්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනකින් සමන්විත වෘත්තිය සමිතියක නිලධාරියකු විසින් හෝ ඔවුන් විසින් ලියවිල්ලකින් බලය පවරන ලද නියෝජිතයකු විසින්; සහ

(ඇ) එම තීරණය යම් සාප්පුවක හෝ කාර්යාලයක, යම් සේවා නියුක්තයන්ට හෝ යම් පන්තියක හෝ වර්ගයක සේවා නියුක්තයන්ට හෝ බලපාන අවස්ථාවක ඒ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සේවා නියුක්තයන්ගෙන් හෝ එම පන්තියේ හෝ වර්ගයේ සේවා නියුක්තයන්ගෙන් සියයට විසි පහකට අඩු නොවන ගණනක් විසින් හෝ ඒ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි සේවා නියුක්තයන්ගෙන් හෝ එම පන්තියේ හෝ වර්ගයේ සේවා නියුක්තයන්ගෙන් සියයට විසි පහකට නොඅඩු ගණනකින් සමන්විත වෘත්තිය සමිතියක නිලධරයකු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

34. පනතේ 26(4) වන වගන්තිය යටතේ සෑම ඉල්ලුම් පත්‍රයක් ම -

(අ) ලියවිල්ලක් මගින් කරනු ලැබිය යුතු ය; තවද,

(ආ) එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, ඒ හේතු පිළිබඳ සම්පූර්ණ ප්‍රකාශයක් ඇතුළත්ව තිබිය යුතු ය.

LABOUR DEPARTMENT OF SRI LANKA

35. පනතේ III වන කොටස යටතේ තමා වෙත කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් වැඩිදුර විස්තර ඉල්ලා සිටීම හෝ අවශ්‍ය යයි ඔහු සලකන පරීක්ෂණ පැවැත්වීමට සැලැස්වීම හෝ නීත්‍යනුකූල වන්නේ ය.

36. පනතේ 36 වන වගන්තිය යටතේ සේවා නියුක්තයකුට දෙන ලද අවසර පත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට සිදු වන අවස්ථාවක, යෝජිත ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම පිළිබඳව කොමසාරිස්වරයා විසින් අඩුම වශයෙන් මාසයක් කල් තබා ඒ සේවා නියුක්තයාගේ සේවා යෝජක වෙත දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

## IV වන කොටස
## ඇතැම් පන්තිවල සාප්පුවලට හා කාර්යාලවලට අදාළ විධිවිධාන සහ ඒවායේ සේවයේ නියුක්ත තැනැත්තෝ.

1956.03.02 අංක 10,899 දරන ගැසට් පත්‍රය.

37. රසඥයකුගේ, ඖෂධ වෙළෙන්දෙකුගේ, බෙහෙත් ශාලා කරුවකුගේ, දෘෂ්ඨි උපකරණ වෙළෙන්දකුගේ, ශල්‍ය භාණ්ඩ වෙළෙන්දකුගේ හෝ ආයුර්වේද බෙහෙත් වෙළෙන්දකුගේ වෙළදාම හෝ ව්‍යාපාරය පමණක් පවත්වා ගෙන යන යම් ස්ථානයක් පනතේ IV වන කොටසේ විධිවිධාන වලින් නිදහස් වන්නේ ය.

1956.03.02 අංක 10,899 දරන ගැසට් පත්‍රය.

(අ) සංචාරක පරීක්ෂකයකු, සංචාරක නියෝජිතයකු, සංචාරක විකුණුම්කරුවකු හෝ තැරැව්කරුවකු ලෙස හෝ වෙනත් යම් සමාන තත්වයකින් හෝ යම් සාප්පුවක හෝ කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් නියුක්ත කර සිටින සෑම තැනැත්තෙක් ම සාප්පුවක හෝ කාර්යාලයක යම් තැනැත්තකු සේවයෙහි නියුක්ත කර ගනු ලැබිය හැකි සාමාන්‍ය උපරිම කාලසීමාවට අදාළ, පනතේ 3(1) වන වගන්තියේ විධිවිධාන වලින් නිදහස් වන්නේ ය.

1971.08.27 දින අංක 11,174 දරන ගැසට් පත්‍රය.

(ආ) යම් ප්‍රවෘත්ති පත්‍රයක් සංස්කරණය කිරීමේ සහ පළ කිරීමේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා පවත්වාගෙන යන යම් ආයතනයක ව්‍යාපාරයෙහි හෝ ව්‍යාපාරය සම්බන්ධයෙන් සේවයේ නියුක්ත කර ඇති

(1) වාර්තාකරුවකු, හෝ

(2) පුවත්පත් ඡායාරූප ශිල්පියකු

LABOUR DEPARTMENT OF SRI LANKA

වන සෑම තැනැත්තෙක්ම, යම් සාප්පුවක හෝ කාර්යාලයක කටයුතුවල හෝ කටයුතු සම්බන්ධයෙන් යම් එක් දිනයක දී තැනැත්තකු සේවයේ නියුක්ත කරනු ලැබිය හැකි සාමාන්‍ය උපරිම කාල සීමාවට අදාළ, පනතේ 3(1) වන වගන්තියේ විධිවිධාන වලින් නිදහස් වන්නේ ය.

1961.07.21 දින අංක 12,553 දරන ගැසට් පත්‍රය.

(ඇ) අධ්‍යාපනික කාර්යයක් සඳහා පවත්වාගෙන යන යම් ආයතනයක භික්ෂක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තෙක්ම මේ පනතේ විධිවිධාන වලින් නිදහස් වන්නේ ය.

38. එකම සාප්පුවක් තුළ විවිධ වෙළඳාම් හා ව්‍යාපාර පවත්වා ගෙන යනු ලබන සහ, ඒ වෙළඳාම්වලින් හෝ ව්‍යාපාරවලින් කිසිවක්, ඒ සාප්පුව තුළ පවත්වා ගෙන යන්නේ ඒ වෙළඳාම හෝ ව්‍යාපාරය පමණක් නම් සාප්පු වැසීමේ නියමය ඒ සාප්පුවට අදාළ නොවන ස්වභාවයේ වන අවස්ථාවක, යම් සාප්පු වැසීමේ නියමයක කුමක් සඳහන් ව ඇත ද ඒ සාප්පුව කොමසාරිස්වරයාගේ ලියවිල්ලකින් වූ අවසරය ඇතිව ඒ වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ කාර්යය සඳහා පමණක් විවෘතව තැබිය හැකි ය.

39. (1) අධිනීතිඥයකු, නීතිඥයකු, හෝ නොතාරිස්වරයකු විසින් වෘත්තිය කාර්යයන් සඳහා පවත්වා ගෙන යනු ලබන සෑම ආයතනයක් ම සහ සාත්තු නිවාසයක කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන සෑම ආයතනයක් ම පනතේ කාර්යය සඳහා කාර්යාලයක් වන්නේ ය.

(2) මේ නියෝගවල ''සාත්තු නිවාසය'' යන්නට 1949 සාත්තු නිවාස (විධිමත් කිරීමේ) පනතෙහි ඇති අර්ථයම ඇත්තේ ය.

1956.03.02 දින අංක 10,899 දරන ගැසට් පත්‍රය.

39අ. යම් ස්ථානයක් තුළ -

(අ) රෙදි අපුල්ලා මැදීමේ, හෝ;

(ආ) ඇඳුම් පැළඳුම් හෝ වෙනත් ද්‍රව්‍ය ඩයි කිරීමේ හෝ ඩ්‍රයි ක්ලීන් කිරීමේ; හෝ

(ඇ) ඡායාරූප ගැනීමේ



LABOUR DEPARTMENT OF SRI LANKA

ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි ද, ඒ ස්ථානය පනතේ කාර්යය සඳහා සාප්පුවක් වන්නේ ය.

1957.09.27 දින අංක 11,174 දරන ගැසට් පත්‍රය.

39ආ. මෙහි පහත සඳහන් ආයතන, පනතේ කාර්යය සඳහා කාර්යාල වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(1) යම් ප්‍රවෘත්ති පත්‍රයක් සංස්කරණය කිරීමේ සහ පළ කිරීමේ ව්‍යාපාරයේ කාර්යය සඳහා පවත්වා ගෙන යන සෑම ආයතනයක් (එහි මුද්‍රණ අංශය හැර):

එසේ වුවද, එවැනි ආයතනයක, පඩි පාලක සභා ආඥා පනතේ 6 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් පඩි පාලක සභා ආඥා පනතේ 11 වන කොටසේ විධිවිධාන අදාළ කර ඇති යම් ව්‍යාපාරයක හෝ වැඩක නියුක්ත කරනු ලැබ ඇති යම් තැනැත්තකුට පනතේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

1957.09.27 දින අංක 11,174 දරන ගැසට් පත්‍රය.

(2) මෙහි පහත සඳහන් යම් ව්‍යාපාරයක කාර්යය සඳහා පවත්වා ගෙන යන සෑම ආයතනයක් -

- (අ) ගණකාධිකාරීවරයකුගේ,
- (ආ) ගෘහ නිර්මාණ ශිල්පියකුගේ,
- (ඇ) මිනින්දෝරුවරයකුගේ,
- (ඈ) වෙන්දේසිකරුවකුගේ,
- (ඉ) තක්සේරුකරුවකුගේ,
- (ඊ) සැළසුම්කරුවකුගේ,
- (උ) ඇගයුම්කරුවකුගේ,
- (ඌ) ප්‍රවෘත්ති ඒජන්සියක, සහ
- (එ) චාරිකා හා සංචාරක ඒජන්සියක; ව්‍යාපාරය.

1958.10.24 දින අංක 11,564 දරන ගැසට් පත්‍රය.

(3)
- (I) යම් වෘත්තිය සමිතියක,
- (II) යම් සකසුරුවම් හෝ අන්‍යෝන්‍යාධාර සංගමයක,
- (III) යම් අර්ථසාධක අරමුදලක හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක,
- (IV) සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක,
- (V) යම් පාසලක හෝ වෙනත් අධ්‍යාපන ආයතනයක

LABOUR DEPARTMENT OF SRI LANKA

කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා පවත්වා ගෙන යන සෑම ආයතනයක්.

1961.07.21 දින අංක 12,553 දරන ගැසට් පත්‍රය.

(4) යම් අධ්‍යාපනික කාර්යයක් සඳහා පවත්වා ගෙන යන ආයතනයකට අනුබද්ධ වූ සහ ඒ ආයතනයේ ශිෂ්‍යයන් නේවාසිකව සිටීම සඳහා පාවිච්චි කරන්නා වූ නේවාසිකාගාරයක් හෝ ශිෂ්‍ය නිවාසයක් ද ඇතුළුව, අධ්‍යාපනික කාර්යය සඳහා පවත්වා ගෙන යන සෑම ආයතනයක්.

(5) සමාජ ශාලාවක කාර්යය සඳහා පවත්වා ගෙන යන සෑම ආයතනයක්.

(6) වෘත්තිය කාර්යය සඳහා -

(අ) වෛද්‍ය වෘත්තිකයකු;

(ආ) දන්ත ශල්‍ය වෛද්‍යවරයකු; හෝ

(ඇ) දන්ත වෛද්‍යවරයකු

විසින් පවත්වා ගෙන යන සෑම ආයතනයක්.

## V වන කොටස
## සාමාන්‍ය

40. පනතේ 45 (2) වන වගන්තියේ සහ 50 වන වගන්තියේ කාර්යය සඳහා නියමිත නිලධාරියා පහත සඳහන් නිලධරයන්ගෙන් කිසිවකු විය යුතු ය.

කොමසාරිස්වරයා;

නියෝජ්‍ය කොමසාරිස්වරයකු;

සහකාර කොමසාරිස්වරයකු;

කම්කරු පරීක්ෂක.

41. පනතේ 53 වන වගන්තිය යටතේ දෙනු ලැබීමට නියමිත සෑම දැන්වීමක් ම මෙහි උප ලේඛනයේ "එ" ආකෘතියට සාරානුකූල විය යුතු ය.

42. මේ පනත යටතේ හෝ මේ නියෝග යටතේ සේවා යෝජකයකු වෙත භාර දෙනු ලැබීමට නියමිත සෑම දැන්වීමක් ම, 43 වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර -

LABOUR DEPARTMENT OF SRI LANKA

(අ) සේවා යෝජක තනි පුද්ගලයකු වන අවස්ථාවක සේවා යෝජක වෙත ම හෝ තත්කාලයෙහි සේවා යෝජකගේ සාප්පුව හෝ කාර්යාලය භාරව සිටින කළමණාකරු හෝ තැනැත්තා වෙත;

(ආ) සේවා යෝජක සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක ඒ මණ්ඩලයේ කළමණාකාර අධ්‍යක්ෂ හෝ ලේකම් වෙත හෝ තත්කාලයෙහි එම සේවා යෝජකගේ සාප්පුව හෝ කාර්යාලය භාරව සිටින කළමණාකරු හෝ තැනැත්තා වෙත;

(ඇ) සේවා යෝජක ව්‍යාපාරික ආයතනයක් වන අවස්ථාවක ව්‍යාපාරික ආයතනයේ යම් හවුල්කරුවකු වෙත හෝ සේවා යෝජකගේ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි කළමණාකරු වෙත; සහ

(ඈ) සේවා යෝජක සමුපකාර සමිතියක් වන අවස්ථාවක සමිතියේ සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික වෙත හෝ සේවා යෝජකගේ සාප්පුවෙහි හෝ කාර්යාලයෙහි කළමණාකරු වෙත බාර දෙනු ලැබිය හැකි ය.

43. කැමැත්තෙන් යම් තීරණයක් කිරීමේ කාර්යය සඳහා හෝ පනතේ විධිවිධාන යටතේ යම් පරීක්ෂණයක් පැවැත්වීමේ කාර්යය සඳහා -

(1) සේවා යෝජක වෙත භාරදීමට නියමිත යම් දැන්වීමක් -

(අ) වෘත්තිය සමිතියක් විසින් සේවා යෝජක නියෝජනය කරනු ලබන්නේ නම් එම වෘත්තිය සමිතියේ සභාපති, ලේකම් හෝ වෙනත් නිලධාරියකු වෙත; හෝ

(ආ) වෘත්තිය සමිතියක් විසින් සේවා යෝජක නියෝජනය කරනු නොලැබේ නම් 42 වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට බාර දෙනු ලැබිය හැකි ය.

(2) සේවා නියුක්තයන් වෙත බාර දීමට නියමිත යම් දැන්වීමක් -

(අ) වෘත්තිය සමිතියක් විසින් නියුක්තයන් නියෝජනය කරනු ලබන්නේ නම් එම වෘත්තිය සමිතියේ සභාපති, ලේකම් හෝ වෙනත් නිලධාරියකු වෙත; හෝ

LABOUR DEPARTMENT OF SRI LANKA

(ආ) වෘත්තිය සමිතියක් විසින් සේවා නියුක්තයන් නියෝජනය කරනු නොලැබේ නම් 23 (2) (ආ) නියෝගයෙහි සඳහන් සේවා නියුක්තයන්ගේ එක් එක් නියෝජිතයා වෙත හෝ එවැනි නියෝජිතයින් නොමැති අවස්ථාවක ඒ එක් එක් සේවා නියුක්තයා වෙත බාර දෙනු ලැබිය හැකි ය.

44. මේ පනත යටතේ හෝ මේ නියෝග යටතේ යම් තැනැත්තකුට බාර දීමට නියමිත සෑම දැන්වීමක් ම, මේ නියෝගවල වෙනත් විධිවිධාන ප්‍රකාශිතව ම සලසා ඇති අවස්ථාවන්හි හැර, පෞද්ගලිකව බාර දීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීමෙන් හෝ එම තැනැත්තාගේ අන්තිමට දැන සිටි පදිංචි හෝ ව්‍යාපාරික ස්ථානයේ දොරටුවෙහි දැන්වීම ඇලවීමෙන් හෝ බාර දෙනු ලැබිය හැකි ය.

45. 17 (1) (1) වන නියෝගයෙහි සඳහන් වාර්තාව හැර, මේ පනත යටතේ හෝ මේ නියෝග යටතේ හෝ තබා ගැනීමට නියමිත සෑම ලේඛනයක් සහ වාර්තාවක් සේවා යෝජක විසින් අවුරුදු දාහතරක අවම කාලසීමාවකට ආරක්ෂා කොට තබා ගත යුතු ය.

46. එක් එක් සේවා නියුක්තයා වෙනුවෙන් සේවා යෝජක විසින් තබා ගනු ලබන 17 (1) (1) වන නියෝගයෙහි සඳහන් සෑම වාර්තාවක් ම, එම සේවා නියුක්තයාගේ සේවා නියුක්ති ගිවිසුම අවසන් කළ දින සිට අවුරුදු දෙකක කාලසීමාවකට ආරක්ෂා කොට තබා ගත යුතු ය.

47. යම් ප්‍රකාශ නිවාඩු දිනයකට හෝ සේවා නියුක්තයාට දෙන ලද අනුමත නිවාඩුවකට හෝ පෙරාතුවම වූ දිනයක සාමාන්‍ය සේවා නියුක්ති කාලසීමාවක් සඳහා පාරිශ්‍රමිකය ගෙවනු ලැබීමට සේවා නියුක්තයාට හිමිකම් ඇත්තේ යම් ප්‍රමාණයක් මත ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එම සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු (යම් අතිකාල හෝ පාරිතෝෂික දීමනා අත් හැර, එහෙත් ජීවන වියදම අනුව තීරණය කරන ලද යම් විශේෂ ජීවන වියදම් දීමනාවක් ඇතුළත්) මුළු පාරිශ්‍රමිකය -

(අ) එම සේවා නියුක්තයා ට මාසික ගෙවීම් ප්‍රමාණයක් මත ගෙවනු ලබන අවස්ථාවක එම මාසයේ දින ගණනින් බෙදිය යුතු වන්නේ ය;

(ආ) එම සේවා නියුක්තයාට දෙසති ගෙවීම් ප්‍රමාණයක් මත ගෙවනු ලබන අවස්ථාවක දහ හතරෙන් බෙදිය යුතු වන්නේ ය; තවද

(ඇ) එම සේවා නියුක්තයා ට සති ගෙවීම් ප්‍රමාණයක් මත ගෙවනු ලබන අවස්ථාවක හතෙන් බෙදිය යුතු වන්නේ ය.

48. මාසික ගෙවීම් ප්‍රමාණයක් නොවන ගෙවීම් ප්‍රමාණයක් අනුව පාරිශ්‍රමිකය ගෙවනු ලබන යම් සේවා නියුක්තයකුට ප්‍රකාශ නිවාඩු දිනයක් හෝ අනුව නිවාඩුවක් හෝ දී ඇති යම් දිනයක් වෙනුවෙන් පාරිශ්‍රමික ප්‍රමාණය, සාමාන්‍ය සේවා නියුක්ති කාලසීමාව තුළ දි ඔහු එදින ඇත්ත වශයෙන් ම සේවා නියුක්තව සිටියේ නම් එදිනට ඔහුට ලැබීමට හිමිකම් තිබුණු ගෙවීම් ප්‍රමාණයට අඩු නොවන ගෙවීම් ප්‍රමාණයක් විය යුතු ය.

49. කැලි අනු ප්‍රමාණය අනුව පාරිශ්‍රමිකය ගෙවනු ලබන සේවා නියුක්තයකු වන සේවා නියුක්තයකුට ප්‍රකාශ නිවාඩුවක් හෝ අනුමත නිවාඩුවක් හෝ දෙනු ලැබු දිනයක් වෙනුවෙන්, ඒ සේවා නියුක්තයාට ගෙවුනු ලැබිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය -

(අ) ඒ සේවා නියුක්තයා හෝ සේවා නියුක්ත පන්තිය වෙනුවෙන් පනතේ විධිවිධාන යටතේ අවම කාල අනු ප්‍රමාණයක් තීරණය කර තිබෙන අවස්ථාවක එදින එම සේවා නියුක්තයා ඒ අවම කාල අනු ප්‍රමාණයක් මත සාමාන්‍ය සේවා නියුක්ති කාලසීමාව තුළ ඇත්ත වශයෙන් ම සේවයේ නියුක්තව සිටියේ නම් ඒ දිනය වෙනුවෙන් ඒ තීරණය යටතේ එම සේවා නියුක්තයා ට ලැබීමට හිමිකම් තිබුණු පාරිශ්‍රමික ප්‍රමාණය වන්නේ ය. තවද

(ආ) එවැනි කාල අනු ප්‍රමාණයක් තීරණය කර නොමැති අවස්ථාවක, එම ප්‍රකාශ නිවාඩුව හෝ අනුමත නිවාඩුව දෙන ලද මාසය තුළ හෝ අවස්ථාවෝචිත පරිදි මාසයේ කොටස තුළ ඒ සේවා නියුක්තයා විසින් උපයන ලද සාමාන්‍ය දෛනික පාරිශ්‍රමික ප්‍රමාණය වන්නේ ය.

50. අවස්ථාවෝචිත පරිදි මාසය සඳහා හෝ මාසයෙන් කොටස සඳහා සේවා නියුක්තයාගේ මුළු ඉපයුම්, එම නිවාඩු දිනය හෝ නිවාඩුව දෙන ලද මාසය තුළ හෝ මාසයේ කොටස තුළ ඒ සේවා නියුක්තයා ඇත්ත වශයෙන් ම වැඩ කර ඇති දින ගණනෙන් බෙදීමෙන් 49 වන වගන්තියේ කාර්යයන්



LABOUR DEPARTMENT OF SRI LANKA

සඳහා සාමාන්‍ය දෛනික පාරිශ්‍රමික ප්‍රමාණය තීරණය කරනු ලැබිය යුතුය:, එම ප්‍රකාශ නිවාඩු දිනය හෝ අනුමත නිවාඩුව මාසයක පළමුවන දිනයට යෙදෙන විට, එම නිවාඩු දිනය හෝ නිවාඩුව දෙන ලද මාසයට පෙරතුව ම වූ මාසය තුළ සේවා නියුක්තයාගේ මුළු ඉපයුම්, මත, යම් නියෝගයේ ඉහත සඳහන් විධිවිධාන වල දක්වා ඇති ආකාරයට එම ප්‍රමාණය තීරණය කරනු ලැබිය යුතු ය.

51. යම් සේවා නියුක්තයකුට පනතේ 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ප්‍රකාශ නිවාඩු දිනයකට හෝ අනුමත නිවාඩුවකට හිමිකම් ඇත්තා වූ සහ එම නිවාඩු දිනය හෝ නිවාඩුව ඔහුට දෙනු ලැබුවාවූ ද , එම නිවාඩු දිනය හෝ නිවාඩුව, පනතේ 5 වන වගන්තියේ හෝ 7 වන වගන්තියේ විධිවිධාන යටතේ යම් ප්‍රකාශ නිවාඩුවකට ඒ සේවා නියුක්තයාට හිමිකම් ඇති දිනයකට යෙදෙන්නා වූ ද අවස්ථාවක, ඒ සේවා නියුක්තයාට පනතේ 6 වන වගන්තියේ විධිවිධාන යටතේ ඒ වන විට දී ඇති නිවාඩු, නිවාඩු දිනයට හෝ නිවාඩුවට අමතරව අවස්ථාවෝචිත පරිදි 5 වන වගන්තියේ හෝ 7 වන වගන්තියේ විධිවිධාන යටතේ එම සේවා නියුක්තයාට හිමිකම ඇති නිවාඩුව ඔහුට දෙනු ලැබිය යුතු ය.

52. පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද මූල මණ්ඩලයක, රාජ්‍ය නිලධාරියකු වන සාමාජිකයකු හැර සෑම සාමාජිකයකු ම, ඔහු පාරිශ්‍රමික විනිශ්චය අධිකාරයේ රැස්වීමකට සහභාගි වන එක් එක් දිනය වෙනුවෙන් -

(අ) ගමන් වියදම් හැර ඔහු විසින් දරන ලද සියළු වියදම් සඳහා රුපියල් විස්සක දීමනාවකට; සහ

(ආ) (I) එම රැස්වීම පැවැත්වෙන ස්ථානයට සහ එම ස්ථානයේ සිට ගමන, එම සාමාජිකයා පෞද්ගලික මෝටර් රථයකින් හෝ කුලියට ගත් වාහනයකින් කරන්නේ නම්, ඒ ගමනේ එක් එක් සැතපුම හෝ සැතපුමකින් කොටස සඳහා ශත පනහ බැගින් ගණන් බලන ලද මුදලකින්; හෝ

(II) එම ගමන දුම්රියෙන් හෝ බස් රියෙන්, ට්‍රෑම් රථයෙන් හෝ වෙනත් මහජන ප්‍රවාහන ක්‍රමයකින් කරනු ලැබුවේ නම්, එම සාමාජිකයා විසින් ගමන් ගාස්තුව වශයෙන් ඇත්ත වශයෙන් ම ගෙවන ලද මුදලින් සමන්විත ගමන් වියදම්

LABOUR DEPARTMENT OF SRI LANKA

දීමනාවකට හිමිකම් ලබන්නේ ය.

53. පනතේ විධිවිධාන යටතේ හෝ මේ නියෝග යටතේ සේවා නියුක්තයකුට කරනු ලබන සෑම ගෙවීමක් වෙනුවෙන් ම නිසි පරිදි අත්සන් තබන ලද කුවිතාන්සියක් සේවා යෝජක විසින් ලබා ගත යුතු අතර , සේවා නියුක්තයා විසින් එය සේවා යෝජකයාට දිය යුතු ය. එවැනි සෑම කුවිතාන්සියක් ම, (1189 වන අධිකාරය වූ) මුද්දර ආඥා පනතේ විධිවිධාන වලට යටත් වන්නේ ය.

## අර්ථ නිරූපනය

54. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල - ''පනත'' යන්නේ 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාලයීය සේවකයින් පිළිබඳ (සේවය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනත සඳහන් වේ;

''කොමසාරිස්වරයා'', ''නියෝජ්‍ය කොමසාරිස්වරයා'' සහ ''සහකාර කොමසාරිස්වරයා'' යන්නෙන් පිළිවෙලින් ''කම්කරු කොමසාරිස්වරයා'' , ''නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු'' සහ ''සහකාර කම්කරු කොමසාරිස්වරයකු'' අදහස් වේ;

''සේවා නියුක්තයා'' යන්නෙන් සාප්පුවක හෝ කාර්යාලයක සේවයෙහි හෝ සේවය සම්බන්ධයෙන් නියුක්ත කරගනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ.

''පළාත් පාලන ආයතනය'' යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

## ඉවත් කිරීම

55. 1939 ඔක්තෝබර් මස 5 වන දින අංක 8,521 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ, පසුව සංශෝධිත 1939, සාප්පු නියෝග මෙයින් ඉවත් කරනු ලැබේ.

LABOUR DEPARTMENT OF SRI LANKA

## <u>උප ලේඛනය</u>

(10 වන නියෝගය) "අ" ආකෘතිය

සාප්පු සහ කාර්යාලයීය සේවකයින් පිළිබඳ

(සේවය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ) පනත

12 (1) වන වගන්තිය

පදිංචිවීම සඳහා අවසර පත්‍රය

LABOUR DEPARTMENT OF SRI LANKA